

# 14 කඨින පූජෝත්සවය

බෞද්ධ පූජෝත්සව අතර කඨින පින්කමට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. කඨින යන පදය 'තද', 'බලගතු', 'බලවත්' යන අර්ථය දෙන පදයකි. කඨින පින්කමෙන් ලැබෙන ආනිශංස අනෙකුත් පින්කම්වලින් ලැබෙන ආනිශංසවලට වඩා බලවත් ලෙස සැලකීම මේ පින්කමට 'කඨින' යන නාමය ලැබීමට හේතුව ලෙස සැලකේ. සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම උදෙසා අවස්ථාව සලසා දෙන මේ පාඩම, වල්පොළ රාහුල හිමියන්ගේ 'ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය', 'සතොරෝදය ලිපි එකතුව' සහ මහාචාර්ය ජේ. බී. දිසානායකගේ 'සිංහල සිරිත් විරිත්' යන කෘති ආධාර කර ගනිමින් රචනා වූවකි.

කඨින පින්කම සිදු කෙරෙන්නේ වස් කාලය කේන්ද්‍ර කරගෙන යි. වස් යනුවෙන් අදහස් වන්නේ වර්ෂාව යි. වස් කාලය යනු වර්ෂා කාලය ලෙස ගැනේ. වස් කාලයේ දී වස් විසීමේ චාරිත්‍රය මුලින් ම ඇති වුණේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ බුද්ධත්වයෙන් වසර විස්සකට පසුව ය. තදින් වැසි ඇදහැලෙන වස් කාලයේ දී භික්ෂූන් වහන්සේ චාරිකාවේ යෙදෙන විට අලුතින් දලු ලා වැඩෙන තණකොළ ආදියත් පොළොවෙන් උඩට මතු වන සතුනුත් පෑගෙන බවට අන්‍යාගමිකයන් වෙතින් නැගුණු චෝදනා භික්ෂූන් වහන්සේගෙන් දැනගත් බුදු රජාණන් වහන්සේ

"අනුජානාමි භික්ඛවේ වස්සානේ වස්සං උපගන්තුං"
(මහණෙනි, වස්සාන කාලයේ වස් විසීමට අවසර දෙමි.)

යනුවෙන් විනය නීතියක් පැනවූ සේක. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණක් වන්නේ බුදු රජාණන් වහන්සේ අන්‍යාගමිකයන්ගේ අදහස් ද සලකා බලමින් ආගම් අතර සහජීවනය පවත්වාගෙන යෑමට කටයුතු කළ බව යි.

වස් විසීම අනුදැන වදාරන්නට බලපෑ තවත් හේතුවක් වෙයි. යන්ත්‍ර සූත්‍රවලින් රෙදි වියන වර්තමානයේ මෙන් නො ව අතීතයේ දී රෙදි පිළි ඉතා දුර්ලභ විය. ඒ නිසා ම භික්ෂූන් වහන්සේට සිවුරු සුලභ නො වී ය. ඇතැම් භික්ෂූන් වහන්සේ දැඩි වර්ෂාවෙන් තෙමී, දිය බේරෙන සිවුරු ඇතිව, විහාරයට පැමිණ, මාරු කිරීමට වෙනත් සිවුරක් නැති නිසා ඒ තෙතබරිත සිවුර පිටින් ම දවස ගෙවති. එය ශරීර සෞඛ්‍යයට හිතකර නො වේ. වස් කාලයේ දී භික්ෂූන් වහන්සේට එක් තැනක වැඩ විසීමට නියම කිරීමට මේ තත්ත්වය ද සැලකිල්ලට ගැනුණු බව කියවේ.

මෙසේ ආරම්භ වූ වස් විසීම දෙවිධියකින් සිදු වේ. ඒ 'පෙර වස්' හා 'පසු වස්' යනුවෙනි. 'පෙර වස්' වසන භික්ෂූන් වහන්සේ ඇසළ පුර පසළොස්වක පොහොය දින වස් සමාදන් වෙති. එදින සිට තුන් මසක් ගෙවුණු පසු වස් කාලය අවසන් වෙයි. මේ තුන් මාසයට පසුව එළඹෙන්නේ චීවර මාසය යි. මේ මාසය එනමින් හැඳින්වීමට හේතුව 'පෙර වස්' විසූ භික්ෂූන් වහන්සේට කඨින චීවරය පිළිගැන්වෙන්නේ මේ මාසයේ දී වන බැවිනි.

පසු වස් වසන භික්ෂූන් වහන්සේ වස් සමාදන් වන්නේ ඇසළ මසට පසු එළඹෙන නිකිණි මස පුර පසළොස්වක පෝ දින සිට ය. සාමාන්‍යයෙන් වස් ආරාධනාව සිදු කෙරෙන්නේ ගමේ හතර පේරුව නියෝජනය කරමින් එක් දායකයකු විසිනි. ඔහු ඇසළ පෝ දිනට පෙර දිනක පන්සලට ගොස් පන්සලේ හාමුදුරුවන්ට මේ ආරාධනය කරයි. ඒ ගමනේ දී වැසි සළුව නම් වූ සුදු රෙදි කඩක් ද රැගෙන යනු ලැබේ. අදාළ දායකයා බුලත් කොළ තුනකින් ගොටුවක් සාදා එය වැසි සළුව මත තබා නායක හාමුදුරුවන්ට පිළිගන්වා 'අප කෙරෙහි අනුකම්පාවෙන් මේ ආරාමයේ වස් වසන' මෙන් උන් වහන්සේට ඇරයුම් කරයි.

වස් ආරාධනාවේ දී වැසි සළු පූජා කිරීම අතීතයේ සිට ම සිදු කෙරෙන චාරිත්‍රයකි. වැසි සළු පූජා කිරීම සෑම ප්‍රදේශයක ම පාහේ සිදු කෙරුණ ද වස් ආරාධනා කිරීම ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් ආකාරවලින් සිදු කරනු දැකිය හැකි ය. වස් කාලය ඇතුළත නොයෙක් වස් පින්කම් පන්සලේ දී පැවැත්වෙයි. මල් පූජා, ගිලන්පස පූජා, බෝධි පූජා, ධර්ම දේශනා ආදිය මේ අතර වෙයි. කඨින පින්කම මේ සියලු පින්කම් අතුරින් ප්‍රධාන පින්කම වෙයි. මේ පින්කමේ දී විශේෂයෙන් සිදු වන්නේ පෙර වස් විසූ භික්ෂූන් වහන්සේට කඨින චීවරයක් පූජා කිරීම යි.

කඨින චීවර පූජා කර්මය අනෙකුත් චීවර පූජා කර්මවලට වඩා බලවත් පුණ්‍ය කර්මයක් වන බව බෞද්ධ පිළිගැනීම යි. ඊට හේතුව මේ පින්කම එක් විහාරස්ථානයක සිදු කළ හැකි වන්නේ වසරකට එක් වරක් පමණක් වීම යි. ඒ නිසා ම කඨින චීවරය පිළියෙල කිරීමට ගමේ සියලු දෙනා ම සම්මාදන් වෙති. කඨින පින්කම භාර ගත් දායකයාගේ නිවෙසට ගොස් එම චීවරය සකස් කිරීම වෙනුවෙන් පුණ්‍යාධාර කිරීම වර්තමානයේ පවා දක්නට ලැබේ.

කඨින චීවරය සකස් කිරීමට යොදා ගැනෙන වස්ත්‍රය අදාළ දායකයාගේ නිවෙසේ සිට පන්සලට ගෙන යනු ලබන්නේ විශේෂ පෙරහැරකිනි. මෙය කඨින පෙරහැර නමින් හැඳින්වේ. කඨින පෙරහැර අදාළ විහාරස්ථානයට අයත් සතර පේරුවේ ම මංමාවත්වල ගමන් කිරීම සාමාන්‍ය සිරිත යි. ඒ නිසා පෙරහැර ගමන් කරන එම මාවත් ගම්වැසියන් විසින් පිරිසිදු කරනු ලැබේ. මාර්ගය අවහිර කරන ගස් වැල් කපා එළි පෙහෙළි කොට තණකොළ උගුල්වා පවිත්‍ර කිරීම සියලු දෙනා අතින් ම සිදු වන්නේ ආගම් භේදයක් නොතකා ය. වීථි දෙපස ඇති සියලු නිවෙස්වල බෞද්ධ කොඩියක් ඔසවනු ලැබේ. ආගම් භේදයකින් තොරව මග දෙපස ඇති සියලු නිවෙස් විදුලි බුබුළුවලින් සැරසීම වූ කලි වර්තමාන ආගමික සහජීවනයේ ප්‍රතිඵලයක් වැනි ය.

කඨින පෙරහැර ආරම්භ වන්නේ උදේ පාන්දර ය. කඨිනය භාර ගත් දායකයාගේ නිවෙසේ සිට ඇරඹෙන මේ පෙරහැරේ දී කඨින වස්ත්‍රය හිස මත තබා ගත් දායකයා උඩු වියනක් යටින් ගමන් කරයි. පෙරහර යන අතරමග දී තම කැමැත්ත පරිදි එක් එක් පුද්ගලයෝ මේ වස්ත්‍රය හිස මතින් ගෙන යති. කඨින වස්ත්‍රය පන්සල කරා ගෙන යෑමට තමනුත් සම්මාදම් වීම මහඟු පුණ්‍යකර්මයක් ලෙස ඔවුහු සලකති.

අතීතයේ දී උණ බටවලින් සැකසූ පන්දම් එළියෙන් හෝ ලන්තෑරුම් එළියෙන් ගමන් කළ සරල පෙරහැරක් වූ මෙය වර්තමානය වන විට විචිත්‍රවත් පෙරහැරක් බවට පත්ව ඇත. පෙර දී සැදැහැති උපාසක උපාසිකාවන්ගේ සාධු නාදය, මල් වට්ටි රැගත් ළමයින්ගේ ශාන්ත ගමන් විලාසය ආදියෙන් පමණක් සමන්විත වූ කඨින පෙරහැරට වර්තමානය වන විට කසකරුවන්, ගිනිබෝලකරුවන්, නර්තන ශිල්පීන්, බෙර වාදකයන්, මල් බයිසිකල්කරුවන් පමණක් නො ව ඇතැම් විට හස්තීන් පවා එක් වී ඇති අයුරු දැක ගත හැකි ය.

කඨින පෙරහැරේ ගමන් කිරීමෙන් වෙහෙසට පත් වූවන්ගේ වෙහෙස නිවීම පිණිස ඇතැම්හු සිසිල් පැන්, තේ, කෝපි ආදි නොයෙක් දන්සල් පවත්වති. පෙරහැරේ ගමන් කරන්නන්ගේ විඩා නිවා ගැනීමට මෙවැනි දන්සල් මහඟු පිටුබලයක් වෙයි.

පෙරහර තම නිවෙස අසලින් ගමන් කරන විට පන්සලට අවශ්‍ය යම් දෙයක් පූජා කිරීම හෝ ඒවා රැගෙන පෙරහැරට එක් වීම ගම්වැසියන්ගේ සිරිත යි. කඨින පෙරහැර පන්සලට ළඟා වන විට පන්සල් බිම සැදැහැතියන්ගෙන් පිරී යයි. ඇතැම් විහාරස්ථානවල ඊට පෙර දිනයෙහි සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් ද පැවැත්වීම චාරිත්‍රයකි. මේ පිරිතේ අවසානය හා පෙරහැර පන්සලට ඇතුළු වීම එක ම විටක සිදු වෙයි. ඒ මොහොත 'කොස් නැටි පේන වෙලාව' හෝ 'දහසක් බුදුන් බුදු වන පාන්දර' ලෙස ගැමි ව්‍යවහාරයේ සඳහන් වෙයි. කඨින පෙරහැර ලංකාවේ විවිධ ප්‍රදේශවල නොයෙක් ආකාරයෙන් පැවැත්වේ. ඇතැම් පළාතක මේ පෙරහැර රාත්‍රිය මුළුල්ලේ ම ගම පුරා ගමන් කරනු දක්නට ලැබේ. කඨින වස්ත්‍රය ගෙන යෑමෙහි ද වෙනස්කම් පවතී. ඇතැම් ප්‍රදේශවල සිදු කෙරෙන්නේ පන්සලට අවශ්‍ය බඩු ද පෙර දින පන්සලට ගොස්, එහි ඇති කප්රුක නමින් සකසන ලද විශේෂිත වූ කෘත්‍රිම ගසක එල්ලීම යි.

පන්සලට භාර දුන් කඨින වස්ත්‍රය එම දවස ඇතුළත කපා, මසා, පඬු ගසා, වේළා ගැනෙන විහාරස්ථාන ද වෙයි. ඇතැම් විහාරස්ථානයක මේ සියලු කටයුතු කෙරෙන්නේ භික්ෂූන් වහන්සේ අතිනි. චීවරය මසා නිම කළ පසු ඊට පඬු පෙවීම සිදු කෙරේ. තද කහටක් සහිත නුග, වරකා වැනි ගස්වල පට්ටා යොදා ගෙන පඬු ගසනු ලැබේ. පඬු ගැසූ කඨින චීවරය භික්ෂූන් වහන්සේ මධ්‍යයෙහි තබා පුද්ගල නාමයකින් තොරව, සාංඝිකව පූජා කිරීම සිදු වේ. මේ පූජාව පිළිගත් භික්ෂූන් වහන්සේ පෙර වස් විසූ, වස් ආරක්ෂා කර ගත්, සුදුසුකම් සම්පූර්ණ කළ එක් භික්ෂු නමකට මේ චීවරය පවරති.





කඨින චීවරය පූජා කිරීමට පෙර, එම විහාරස්ථානයේ වස් විසූ සෑම ස්වාමීන් වහන්සේ නමකට ම සිවුරු පූජා කිරීමක් සිදු වේ. එසේ පූජා කෙරෙන සිවුරු 'වස්සාවාසික චීවර' නමින් හඳුන්වනු ලැබේ.

කඨින පින්කම සිදු කෙරෙන දින දහවල් අදාළ විහාරස්ථානයේ දී භික්ෂූන් වහන්සේ විෂයයෙහි පිරිනැමෙන දානය කඨින දානය යි. එම විහාරස්ථානයෙහි වස් විසූ භික්ෂූන් වහන්සේ මෙන් ම විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ආරාධනය පරිදි, අවට සෙසු විහාරස්ථානවලින් වඩින භික්ෂූන් වහන්සේ ද මේ දානය සඳහා සහභාගි වෙති. ගමේ සතර පේරුවේ දායක දායිකාවෝ කලින් භාරගත් පරිදි විවිධ ආහාර වර්ග සකසා ගෙනැවිත් මේ දානය උදෙසා පූජා කරති. අවසානයේ සෑම භික්ෂූන් වහන්සේ නමකට ම පිරිකර ද පූජා කරනු ලැබේ. ඉතා සහයෝගයෙන් කඨින දානයේ කටයුතු නිම කිරීමට ගම්වැසියෝ වග බලා ගනිති. ගම්වැසියන් සියලු දෙනා ම ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් කඨින පෙරහැරටත් කඨින දානයටත් සහභාගී වීම වූ කලි ඔවුනතර පවතින සහජීවනය ප්‍රදර්ශනය වන අවස්ථාවකි.

දායක දායිකාවෝ නැවත සවස් භාගයේ දී විහාරස්ථානයට එක්රැස් වෙති. ඒ 'කඨිනානිශංස ධර්ම දේශනාව' ශ්‍රවණය කිරීමට යි. කඨින චීවරය හිමි වූ ස්වාමීන් වහන්සේ එම චීවරය හැඳ පෙරවා ධර්ම ශාලාවට වැඩම කර, එම ධර්ම දේශනාව සිදු කරති. මේ ධර්ම දේශනාවෙන් කියවෙන්නේ කඨින පින්කමකින් සිදු වන අනුසස් පිළිබඳව යි. කඨිනානිශංස ධර්ම දේශනාවෙන් කඨින පූජෝත්සවය අවසාන වෙයි.

වස් කාලය සැලකෙන්නේ කුඩා සතකුට වත් හිංසාවක් නොවන, අහිංසාවාදි සමයක් ලෙස යි. මේ කාලය තුළ විහාරස්ථානයක වස් වසන භික්ෂූන් වහන්සේ ද විශාල කැප කිරීමක් කරති. පන්සලෙන් බැහැරට නොගොස්, එහි ම වැඩ වෙසෙමින්, තම පෞද්ගලික අවශ්‍යතා පසෙක ලා දායක දායිකාවන් වෙනුවෙන් විවිධ පින්කම් සිදු කිරීමට උන් වහන්සේ කටයුතු කරති. මේ කාලය තුළ යම් අවශ්‍යතාවකට පන්සලෙන් බැහැරට වැඩිය ද නැවත පැමිණෙන දිනය හෝ වේලාව තීරණය කර යෑමට භික්ෂූන් වහන්සේ ක්‍රියා කරති.

කඨින පින්කම අතීතයේ පටන් ලංකාවේ ප්‍රධාන පින්කමක් ලෙස සිදු කෙරුණු බවට සාධක සෙල්ලිපි ආශ්‍රයෙන් සපයා ගත හැකි ය. විහාරේගල සෙල්ලිපියෙහි 'වැසි වසික භාටික' යනුවෙන් වස් ආරාධනාවේ දී පූජා කෙරෙන වැසි සළු පිළිබඳ සඳහන් වෙයි. මීට අමතරව වස් කාලයේ දී භික්ෂූන් වහන්සේ අරියවංස නම් සූත්‍ර දේශනාවක් සිදු කළ බව තෝනිගල සහ ලබුඇටබැඳිගල සෙල්ලිපිවල සඳහන් වෙයි. මෙසේ අතීතයේ සිට ම පින්කමක් ලෙස වැදගත් ස්ථානයක් හිමි කර ගෙන ඇති කඨින පූජෝත්සවය බෞද්ධයාට වැඩදායි පුණ්‍යකර්මයක් ලෙස අගය කළ හැකි ය.

## අවබෝධය

1. බුදු රජාණන් වහන්සේ අන්‍යයන්ගේ මතවලට සවන් දුන් බව ප්‍රකට වන අවස්ථාවක් සඳහන් කරන්න.
2. වැසි සළුව පූජා කරන්නේ කුමක් සඳහා ද?
3. කඨින පින්කමේ දී අන්‍යාගමිකයන් අතර සුහදතාව ප්‍රදර්ශනය කෙරෙන අවස්ථාවක් දක්වන්න.
4. 'කඨින චීවරය' හා 'වස්සාවාසික චීවර' අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
5. ''කඨින පින්කමේ දී ගම්වැසියන්ගේ එකමුතුකම වර්ධනය වෙයි'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.


## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ සහභාගි වූ කඨින පූජෝත්සවයක දී ලැබූ අද්දැකීම පිළිබඳ පන්තිය ඉදිරියේ කෙටි විස්තරයක් කරන්න.
2. ඔබේ වැඩිහිටියකුගෙන් අතීතයේ කඨින පින්කම් පැවැත්වූ ආකාරය පිළිබඳ අසා දැන ගන්න. වර්තමානයේ සහ අතීතයේ මේ පින්කමෙහි හඳුනා ගත හැකි වෙනස් ලක්ෂණ වගුවක සටහන් කරන්න.
3. අන්‍ය ආගමික ස්ථානයක පැවැත්වෙන උත්සවයක් නිරීක්ෂණය කොට, ඒ පිළිබඳ කුඩා ලිපියක් සකස් කරන්න.



# ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

කිරීමක්, සිදුවීමක් හෝ විඳීමක් පිළිබඳ කියවෙන පද ක්‍රියා පද බවත්, එම පද අතුරින් වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා අවසාන ක්‍රියා බවත්, එසේ නොයෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා බවත් මීට ඉහත ශ්‍රේණිවල දී විස්තරාත්මකව ඉගෙන ගෙන ඇත.




මේ ක්‍රියාපද අතුරින් අවසාන ක්‍රියා ගණයට අයත් විධි ක්‍රියා සහ ආශීර්වාද ක්‍රියා ද අනවසාන ක්‍රියා ගණයට අයත් පූර්ව ක්‍රියා සහ මිශ්‍ර ක්‍රියා ද පිළිබඳව ඔබ 7, 8 ශ්‍රේණිවල දී දැනුවත් වී තිබේ. මේ පාඩමෙන් අවසාන ක්‍රියාවලට අයත් වන ප්‍රයෝජ්‍ය ක්‍රියා සහ අනවසාන ක්‍රියාවලට අයත් වන අසම්භාව්‍ය ක්‍රියා පිළිබඳ විමසා බලනු ලැබේ.

## ප්‍රයෝජ්‍ය ක්‍රියා

1. ගුරුවරයා අකුරු ලියයි.
2. ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු **ලියවයි.**

තමන් විසින් සිදු කරනු ලබන ක්‍රියා මෙන් ම අනුන් ලවා කරවනු ලබන ක්‍රියා විශේෂයක් ද සිංහල භාෂාවෙහි දක්නට ලැබේ. ඉහත පළමු වාක්‍යයෙන් තමන් විසින් කරනු ලබන ක්‍රියාවක් පිළිබඳව කියැවෙන අතර දෙවැනි වාක්‍යයෙන් වෙනත් අයකු ලවා කරවනු ලබන

ක්‍රියාවක් පිළිබඳව කියැවෙයි. එසේ අන් අයකු මෙහෙයවීමෙන් කරවනු ලබන ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා ලෙස හැඳින්වේ.

ක්‍රියා මූලයත් විභක්ති ප්‍රත්‍යයත් අතරට 'ව' ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා නිර්මාණය වෙයි.

| ක්‍රියා මූලය | ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය | ක්‍රියාවසාන ප්‍රත්‍යය |
|---|---|---|
| ලිය | ව | යි |
| කර | ව | ති |
| බල | ව | මි |
| නට | ව | මු |
| තන | ව | හු |

ප්‍රයෝජ්‍ය ක්‍රියාව පුරුෂත්‍රයෙහි, කාලත්‍රයෙහි හා ඒක වචන - බහු වචන දෙකෙහි ද කර්තෘ කාරක හා කර්ම කාරකයෙහි ද යෙදෙයි.

| | අනතීත | | අතීත | |
|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථම පුරුෂ | කරවයි | කරවති | කරවීය | කරවූහ |
| මධ්‍යම පුරුෂ | කරවහි | කරවහු | කරවීහි | කරවූහු |
| උත්තම පුරුෂ | කරවමි | කරවමු | කරවීමි | කරවූමු |

සමහර අවස්ථාවල දී එක ම ක්‍රියාව සඳහා ප්‍රයෝජ්‍ය ක්‍රියා රූප කිහිපයක් දක්නට ලැබෙන අයුරු ද හඳුනා ගත හැකි ය.

උදාහරණ:- රකියි - රක්වයි, රක්කයි, රක්කවයි
බසියි - බස්වයි, බස්සයි, බස්සවයි

ප්‍රයෝජ්‍ය ක්‍රියාවල දී අකර්මක ධාතු සකර්මක බවට පත් වේ.

| | (අ) | | (ආ) |
|---|---|---|---|
| උදාහරණ:- | මල්ලී අඬයි | - | අයියා මල්ලී අඬවයි |
| | දරුවා නායි | - | අම්මා දරුවා නාවයි |

(අ) යටතේ ඇති වාක්‍ය දෙක ම කර්ම පද නො යෙදුණු අකර්මක වාක්‍ය වේ. 'අඬයි' 'නායි' යන අකර්මක ක්‍රියා 'අඬවයි' හා 'නාවයි' යනුවෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා බවට පත් කළ විට 'මල්ලී' සහ 'දරුවා' යන පද කර්ම පද බවට පත් වෙයි.

සකර්මක ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා බවට පත් කිරීමේ දී බහු කර්මක වෙයි.

| | (අ) | | (ආ) |
|---|---|---|---|
| උදාහරණ:- | නංගී ගීත ගයයි | - | ගුරුතුමිය නංගී ලවා ගීත **ගයවයි** |
| | වඩුවා පුටුව සාදයි | - | තාත්තා වඩුවා ලවා පුටුව **සාදවයි.** |

(ආ) කාණ්ඩයට අයත් වාක්‍යවල දී 'නංගී' සහ 'ගීත' යන පදත් 'වඩුවා' සහ 'පුටුව' යන පදත් කර්ම පද බවට පත් ව ඇත. එබැවින් එම ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍ය බහු කර්මක පද බවට පත්ව තිබෙන බව හඳුනා ගත හැකි ය.

## අසම්භාව්‍ය ක්‍රියා

අනවසාන ක්‍රියා ප්‍රභේදයක් වන අසම්භාව්‍ය ක්‍රියාවල ස්වරූප දෙකක් දක්නට ලැබේ.

1. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
2. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

### කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

නිශ්චිත කාලසීමාවක් හැඟවෙන ක්‍රියා රූප කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ලෙස හැඳින්වෙයි.

උදාහරණ:- නිළියක **නටද්දී** ප්‍රේක්ෂකයෝ බලා සිටියහ.

මේ වාක්‍යයෙහි 'බලා සිටීම' සිදු වී ඇත්තේ නිළියක නැටීම සිදු වන විට ය. ඒ අනුව බලා සිටීමේ කාර්යය සිදු වූ නිශ්චිත කාලය කුමක් ද යන්න 'නටද්දී' යන ක්‍රියා රූපයෙන් කියවේ.

මේ ක්‍රියා රූප නිර්මාණය කර ගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රත්‍යය යෙදේ.

| | |
|---|---|
| ත | කියත |
| | **කියත** උත් මෙතෙපල ආයෙය ඇදුරු ගුත්තිල |

| | |
|---|---|
| **ත්** | නැගෙත් |
| | හිරු **නැගෙත්** මල් පිපේ. |

| | |
|---|---|
| **දී** | සිටිය දී |
| | තාත්තා එතැන **සිටිය දී** මම ගෙදර ආවෙමි. |
| **ද්දී** | පැමිණෙද්දී |
| | මා නිවසට **පැමිණෙද්දී** අම්මා උයමින් සිටියා ය. |

| | |
|---|---|
| **ම** | ලැබුණා ම |
| | අක්කාගෙන් ලිපියක් **ලැබුණා ම** මටත් දන්වන්න. |

කෘදන්ත නාමයකට පසුව කාලවාචී පද යෙදීමෙන් ද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා නිර්මාණය වේ.

| | |
|---|---|
| **විට** | සීනු හඬ ඇසෙන **විට** ළමයි රැස්වීම් ශාලාවට පැමිණියහ. |
| **කොට** | මාමා ගෙදර එන **කොට** කුඩා පුතා ඉදිරියට දුවයි. |
| **කල්හි** | ලේඛකයන් පොත් ලියන **කල්හි** පාඨකයෝ සතුටු වෙති. |
| **සඳ** | දිගු කලකින් ඔවුනොවුන් මුණගැසුණු **සඳ** මිතුරෝ සතුටට පත් වූහ. |
| **කල** | දරුවා ශිල්ප උගත් **කල** දෙමවුපියෝ සතුටු වෙති. |

## අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

කිසියම් ක්‍රියා රූපයක් මගින් අවිනිශ්චිත බවක් හැඟවෙන්නේ නම් එවැනි ක්‍රියා අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා නම් වේ.

උදාහරණ:- ශිෂ්‍යයන් පාසල් **ගියොත්** ගුරුවරු උගන්වති.
අමුත්තකු නිවෙසට **පැමිණියොත්** වැඩිහිටියකුට දන්වන්න.
ඔහු ලිපියක් **යැව්වත්** ලේකම්තුමා එයට පිළිතුරක් නොඑවී ය.

අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා නිර්මාණය වන ආකාර කිහිපයකි. ඒ සඳහා පහත සඳහන් ප්‍රත්‍යය යෙදේ.

| | |
|---|---|
| තු | ඔබ එය **කරතුදු** මම නො කරමි. |
| ත | **යත** බැරි නො වේ. |
| හොත් | මල්ලී එහි ගිය **හොත්** මම ද එහි යමි. |
| තොත් | ඔවුන් එසේ **කියතොත්** මම ද එය පිළිගනිමි. |
| ඔත් | ඔවුන් එසේ **කළොත්** අපි ද එය අනුගමනය කරමු. |
| ඔතින් | දරුවන් පාසල් **ගියොතින්** දෙමාපියෝ සතුටු වෙති. |

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් ක්‍රියා පද ප්‍රයෝජ්‍ය ක්‍රියා පද බවට හරවා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

   i. උයයි ii. කරමු iii. කඩයි

   iv. බසිති v. කියමි

2. **කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද යොදා වාක්‍ය දෙකක් වශයෙන් දී ඇති පහත සඳහන් වාක්‍ය තනි වාක්‍යයක් බවට පත් කරන්න.**

   i. පාසලේ ආරම්භක සීනුව නාද විය. සිසුහු රැස්වීම් භූමිය කරා පිටත් වූහ.

   ii. රෝගියා වේදනාවෙන් කෑගසයි. වෙදියා ඔහුට බෙහෙත් ලබා දෙයි.

   iii. ගිලන් රථයේ හඬ ඇතින් ඇසිණි. රියැදුරෝ එම රථයට යෑමට ඉඩ සලසා දුන්හ.

   iv. ක්‍රමයෙන් අඳුර පැතිරිණි. කුරුල්ලෝ කැදලි කරා පියඹා ගියහ.

   v. ජාතික ගීය වාදනය කෙරිණි. සියල්ලෝ සීරුවෙන් සිටගත්හ.

3. **පහත සඳහන් ක්‍රියා පද අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද බවට හරවා වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

   i. වසියි ii. යයි iii. කියවයි

   iv. අඬයි v. නළවයි

4. **පෙළපොතෙහි පාඩම් කිහිපයක් කියවා එම පාඩම්වල ඇතුළත් ප්‍රයෝජ්‍ය ක්‍රියා සහ අසම්භාව්‍ය ක්‍රියා වර්ග දෙකට අයත් පද තෝරා වගුවක සටහන් කරන්න.**